# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2330/05 - 2023 මැයි මස 04 වැනි බ්‍රහස්පතින්දා - 2023.05.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් කොටසක්, කහවත්ත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් කොටසක් සහ ගොඩකවෙල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් කොටසක් සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම**

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය, ප්‍රසන්න රණතුංග වන මා හට 1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරි (සංශෝධිත) පනතේ 8 (ඊ) වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, 2023 පෙබරවාරි මස 16 වන දින නාගරික සංවර්ධන අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය විසින් කරන ලද නිර්දේශයන් සලකා බැලීමෙන් පසු, පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් කොටසක්, කහවත්ත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් කොටසක් සහ ගොඩකවෙල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් කොටසක් සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කරමි.

**ප්‍රසන්න රණතුංග** (පා.ම),
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය.

2023 අප්‍රේල් මස 28 වන දින,
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය,
17 හා 18 මහල,
''සුහුරුපාය'',
සුභූතිපුර පාර,
බත්තරමුල්ල.

EOG 05 - 0005/1

---

**පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් කොටසක්, කහවත්ත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් කොටසක් සහ ගොඩකවෙල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් කොටසක් සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම පිළිබඳ දැන්වීමයි**

1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරිය (සංශෝධිත) පනතින් සංශෝධිත 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 8 (අ) වගන්තිය ප්‍රකාරව පිළියෙල කරන ලද, පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් කොටසක්, කහවත්ත ප්‍රාදේශීය සභා


1A - PG 6315 — 46 (2023/05)


මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

බල ප්‍රදේශයෙන් කොටසක් සහ ගොඩකවෙල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් කොටසක් සඳහා වූ සංවර්ධන සැලැස්ම 2023 අප්‍රේල් මස 28 වන දින, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග වන මා විසින්, එකී 1982 අංක 04 දරන නාගරික සංවර්ධන අධිකාරිය (සංශෝධිත) පනතේ 8 (ඊ) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව අනුමත කළ බව, එකී පනතේ 8 (උ) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනතාව වෙත දැනුම් දෙමි.

**ප්‍රසන්න රණතුංග** (පා.ම),
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය.

2023 මැයි මස 03 වන දින,
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය,
17 හා 18 මහල,
''සුහුරුපාය'',
සුභූතිපුර පාර,
බත්තරමුල්ල.

EOG 05 - 0005/2

---

**පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් කොටසක්, කහවත්ත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් කොටසක් සහ ගොඩකවෙල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් කොටසක් සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම**

1982 අංක 4 දරන පනතින් සංශෝධිත 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 8 (අ) වගන්තියේ බලතල ප්‍රකාරව පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් කොටසක්, කහවත්ත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් කොටසක් සහ ගොඩකවෙල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් කොටසක් සඳහා වූ සංවර්ධන සැලැස්ම නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ගරු ප්‍රසන්න රණතුංග මැතිතුමා විසින්, එකී පනතේ 8 (ඊ) වගන්තියෙන් එතුමන් පැවරී ඇති බලතල ප්‍රකාරව 2023 අප්‍රේල් මස 28 වන දින අනුමත කරන ලද බව මහජනතාව වෙත මෙයින් දැනුම් දෙමි.

**නිමේෂ් හේරත්,**
සභාපති,
නාගරික සංවර්ධන අධිකාරිය.

2023 මැයි මස 03 වන දින.

EOG 05 - 0005/3

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.